**කොළඹ මහා නගර සභාව**
**පුරප්පාඩු දැන්වීම**

**<u>කොළඹ මහා නගර සභාව වෙත රියදුරන් ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ලබා ගැනීම.</u>**

01. තනතුර :- රියදුරු (ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත)

02. දීමනාව :- වැඩ කරන එක් දිනක් සඳහා දිනකට රු.2500.00ක දීමනාවක්

03. කායික සුදුසුකම් :- i. අවම උස අඩි 5'
ii. දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික හා මානසික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතුය.

04.වයස :- අයදුම්පත් භාරගන්නා දිනට අවු 21 ත් 42 ත් අතර

05. අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.( එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)

06. වෘත්තීය සුදුසුකම් :- i. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.
ii. 'ඩී' පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

07. පළපුරුද්ද :- රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක ( 03) පළපුරුද්දක් තිබීම.

08.වෙනත් සුදුසුකම් :-
අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළයුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පලාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

09. බඳවා ගැනීමේ ක්‍රමය :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

- මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව සකස් කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "**ශ්‍රම මිලදී ගැනීම - රියදුරු**" ලෙස සඳහන් කර 2025.10.17 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව, පුරහල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය නාගරික කොමසාරිස් සතුවේ.

2025.10.01 දින,

පාලිත නානායක්කාර,
නාගරික කොමසාරිස්.

කොළඹ මහා නගර සභාව,
පුරහල,
කොළඹ - 07.